# සිනමා වාරණය මඟින් අධ්‍යක්ෂවරයාගේ පරිකල්පනය විෂයයෙහි ඇති කෙරෙන බලපෑම පිළිබඳ විමසීමක්: 80 දශකයේ බිහි වූ චිත්‍රපට ඇසුරින්

ඩබ්. චාන්දනී[1]

වර්ෂ 1900 දී පමණ බිහි වූ සිනමාව, රූපය ආත්මය කොටගත් සංශ්ලේශී කලා මාධ්‍යයකි. සිනමා කලාවේ ව්‍යාප්තිය සමඟ එයට වාරණ නියෝග ද පැනවිණ. පොදු යහපතට නුසුදුසු හා පොදු යහපතට අහිතකර පදනම මත, කතා කිරීම හෝ ලිවීම හෝ තහනම් කිරීම හෝ යටපත් කිරීම වාරණය යනුවෙන් අදහස් වේ. සිනමා කෘතියක් මඟින් සමාජ යථාර්ථය බොහෝ දුරට ස්පර්ශ කරන බැවින් වාරණය මඟින් අධ්‍යක්ෂවරයාගේ පරිකල්පනය විෂයයෙහි ඇති කෙරෙන බලපෑම සොයා බැලිය යුතු ය. සම්මතයක් ලෙස සිනමා කෘතියක් වාරණය කිරීමේ බලය ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයට හිමි වේ. සාමාන්‍යයෙන් ලිංගිකත්වය, ප්‍රචණ්ඩත්වය හා දේශපාලනය යන කරුණු මත පදනම් ව වාරණය සිදු වන අතර ඊට පරිබාහිර ව අධ්‍යක්ෂවරයා විසින් ම ස්වයං වාරණය සිදු කරන අවස්ථා ද ඇති බව විචාරකයෝ පෙන්වාදෙති. සිනමා විෂය ක්ෂේත්‍රය අලළා ලියැවුණු කෘති ඇසුරින් කරන ලද මේ පර්යේෂණයෙන් අනාවරණය වූ පරිදි, වාරණය හේතු කොටගෙන අධ්‍යක්ෂවරයාගේ පරිකල්පනය ඇතැම් විට වෙනස්වීම්වලට බඳුන් වේ. ධර්මසේන පතිරාජගේ 'සොල්දාදු උන්නැහේ', 'බඹරු ඇවිත්', ඩී. බී. වර්ණසිරිගේ 'සත්‍යග්‍රහණය' යන චිත්‍රපට අධ්‍යක්ෂවරයා වාරණය සම්බන්ධයෙන් ලැබූ පූර්ව අද්දැකීම් පදනම් කොට, පරිකල්පනය වෙනස් කළ අවස්ථාවන්ට නිදසුන් ය. එමඟින් අධ්‍යක්ෂවරයා සිනමා කෘතියෙන් නිරූපණය කිරීමට උත්සාහ කළ සමාජ යථාර්ථය ද විපරිණාමය විය හැකි ය. ඒ අනුව සිනමා වාරණය මඟින් අධ්‍යක්ෂවරයාගේ පරිකල්පන විෂයයෙහි බොහෝ දුරට බලපෑම් ඇති කෙරෙන බව විද්‍යමාන වේ.

**ප්‍රමුඛ පද:** සිනමාව, වාරණය, අධ්‍යක්ෂවරයා, පරිකල්පනය, රැඟුම් පාලක මණ්ඩලය

[1] සිංහල අධ්‍යයනාංශය